**කොවිඩ් 19 - සති පාසල - සබරගමු පළාත - නිවිතිගල අධ්‍යාපන කලාපය**

**9 ශ්‍රේණිය - සිංහල-දෙවන වාරය - පලමු සතිය**

**7වන පාඩම- දැසේ නිල් පැහැය**

**පැවරුම් අංක - 01**

- **වරහන් තුළ ඇති වචන උපයෝගී කර ගනිමින් හිස් තැන් පුරවන්න**

  1.මිනිසාගේ .......................... පුළුල් කරන අංගයකි කවිය.

  2.කාව්‍ය නිර්මාණ රස විඳීමෙන් ජීවිතාවබෝධය සමග ............................පිටුබලයක් ද ලැබේ.

  3................................කවි රස විඳීමටහා කවි නිර්මාණයට අවශ්‍ය වේ.

  4................................කාව්‍ය සංග්‍රහය 1974 වසරේදී රාජ්‍ය සම්මානයෙන් පිදුම්ලද කාව්‍ය සංග්‍රහයකි.

  (ජීවිතාවබෝධය , රන්තැටියක කඳුළු ,කාව්‍ය නිර්මාණයට ,සහජ හැකියාව)

- **පිළිතුරු සපයන්න.**
  1. මෙම පද්‍ය පන්තියට අනුව මෙහි එන කාන්තාවගේ දැසේ නිල්පැහැය නැතිවීමට බලපෑ හේතු 03 ලියන්න.
  2. දැසේ නිල්පැහැය ගැන කීමට මෙහි යොදාඇති උපමා 02 ක් ලියන්න.
  3. බිරිඳ විසින් සැමියාට පවසන දෙයක් ලියන්න.
  4. "සිතේ සිනා හඬ" යනු කුමක්ද?
  5. රාත්‍රී කාලයේ දී , සමහර විට මෙම කත තනිව සිටිබව කියවෙන කවි පද උපුටා දක්වන්න.
  6. කාන්තාව හඳ මිරිකා කඳුළු සලන්නේ ඇයි?

- **කැමති වස්තු විෂයක් පාදක කර ගෙන මෙබඳු පද්‍ය පන්තියක් නිර්මාණය කරන්න.**

- **'අඹ යාහළුවෝ' කෘතියෙන් ඔබ කැමති පිටු දෙකක් ඇසුරින් නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ පද උපුටා ලියන්න.**

- **පුවත්පත්වල ඇති මෙබඳු කවි පන්ති කපා අලවා පොත් පිංචක් නිර්මාණය කරන්න.**